## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ

සුරාබදු පරීක්ෂක තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2023

සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු පරීක්ෂක තනතුරු තිස් හතරක් (34) සඳහා උපාධිධාරී අයදුම්කරුවන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි.

විභාගය දිවයින පුරා පිහිටි ප්‍රධාන නගරවලදී පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පමණක් පැවැත්වේ. (නගර හා නගර අංක ඇතුළත් ලේඛනය මෙම නිවේදනය අවසානයේ ඇතුළත්ය.) විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කරනු ලබන නගරය/නගර උපලේඛන අංක 01 ට අනුව විය යුතු අතර ඉල්ලුම් කරන ලද නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැතිනම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරය හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය

විභාග කොමසාරිස් ජනරාල් මගින් ලිඛිත තරග විභාගයක් පවත්වා එම විභාගය සමත් අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට යොමු කර ලිඛිත විභාගයෙන් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් මුළු ලකුණු වල එකතුවේ කුසලතා අනුපිළිවෙළ මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරුවලට බඳවා ගනු ලැබේ.

*තනතුරේ සාමාන්‍ය රාජකාරි විස්තරය*

සුරාබදු ආඥාපනත , වස විෂ අබිං හා අන්තරාදායක ඖෂධ ආඥාපනත, දුම්කොළ බදු පනතට අදාළව රාජකාරි කටයුතු ඉටුකිරීම , කාර්යාල පරිපාලනය හා අධීක්ෂණ රාජකාරි ඉටු කිරීම.

02. වැටුප් ප්‍රමාණය : RS-4-2016 රු. 37,030-24x660-52,870/- මාසික වැටුපක් මෙම තනතුරට අයත් වේ. (රා.ප.ච.03/2016 ට අනුව)

**03. වයස් සීමාව :**

අයදුම්කරුවන් 2024.03.22 දිනට වයස අවු.21ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය. (සුරාබදු දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරු දරන උපාධිධාරින් සඳහා වයස් සීමාවක් නැත)

"ඒ අනුව 2003.03.22 දිනට හෝ ඊට පෙර හා 1989.03.22 දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත."

*උදා* :- 2024.03.22 දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා 35 ට නොවැඩි විය යුතු නම්, අයදුම් කළ හැක්කේ 2003.03.22 දින හෝ ඊට පෙර හා 1989.03.22 දින හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අයට පමණි.

**04. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

i. විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි ප්‍රදාන ආයතනයකින් උපාධියක් ලබා තිබීම.

ii. ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයන්ට අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

4.1. *කායික සුදුසුකම් :*

i. අවම උස (පාවහන් නොමැතිව) අඩි 5 අඟල් 06 ක් විය යුතුය. පපුවේ මිනුම් ආශ්වාස නොකොට අඟල් 33 ක් තිබිය යුතුය.

ii. උපැස් යුවලක් හෝ ස්පර්ශ කණ්ණාඩියක් (කන්ටැක් ලෙන්සර්) රහිතව භාණ්ඩ හැඳිනීමේ දෘෂ්ටිය ඇතුළුව අවම වශයෙන් 6/6 හා 6/12 වශයෙන් ඇස් පෙනීමකින් යුක්ත විය යුතුය.

iii. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

4.2. *වෙනත් සුදුසුකම් :*

i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
ii. අයදුම්කරුවන් යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

ලිඛිත තරග විභාගය පිළිබඳ විස්තර

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 01. අභියෝග්‍යතාව | පැය 02 | 100 | 40 % |
| 02. පොදු ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100 | 40 % |

*විභාගය සඳහා වන විෂය නිර්දේශය :*

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01. අභියෝග්‍යතාව | ඉල්ලුම්කරුගේ බුද්ධිය, තර්කනය, තීරණ ගැනීමේ හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. (ගණිතය /චිත්‍ර ගැටළු, සමාන /විරුද්ධ පද ලිවීම, වාක්‍යාංශ /වාක්‍ය සෑදීම, හිස්තැන් පිරවීම පිළිබඳ ප්‍රශ්න ද ඊට ඇතුළත් වෙනවා ඇත.) |
| 02. පොදු ප්‍රශ්න පත්‍රය | ශ්‍රී ලංකාවේ හා ලෝකයේ කාලීන හා සමාජීය සිදුවීම් පිළිබඳව තොරතුරු හා සාමාන්‍ය දැනුම මැන බැලීම |

*යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය* - ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කර ලිඛිත විභාගයෙන් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් මුළු ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරුවලට බඳවා ගනු ලැබේ. එසේ වුව ද කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් නොපිරවීම සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් තීරණය කළ හැකිය.

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් සුදුසුකම් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

| | *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් පශ්චාත් උපාධිය, පශ්චාත් උපාධි ඩිප්ලෝමා ,මූලික සුදුසුකමට අමතරව උපාධියක් සඳහා සහ ප්‍රථම උපාධියේ පන්ති සාමර්ථ්‍යය අනුව | 20 |

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 2. | භාෂා හැකියාව | 10 |
| 3. | ක්‍රීඩා කුසලතා<br>විවිධාකාරයේ ක්‍රීඩා සම්බන්ධයෙන් ජාතික, පළාත්,දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය හා පාසල් තරගවලදී දක්වන ලද වාර්තාගත දස්කම් සඳහා | 35 |
| 4. | වෙනත් කුසලතා<br>විශේෂිත පුහුණු<br>ශිෂ්‍යභට /ස්වේච්ඡා සේවය<br>ආත්මාරක්ෂක පුහුණු සටන් ක්‍රම හෝ තාක්ෂණ පුහුණුව<br>බාහිර ක්‍රියාකාරකම් | 30 |
| 5. | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම් | 05 |
| | එකතුව | 100 |

05. සේවා කොන්දේසි :

i. රාජ්‍ය භාෂා නීතිය හා රජය විසින් වරින් වර පනවනු ලබන සියලුම නීති රෙගුලාසි අනුව ක්‍රියා කිරීමට බැඳී සිටිය යුතුය.

ii. 2310/29 හා 2022.12.14 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්යපරිපාටික රීතිවල I කාණ්ඩයේ III වැනි පරිච්ඡේදය, VII වෙනි පරිච්ඡේදය හා VIII වෙනි පරිච්ඡේදය අදාළ වේ.

iii. ශාරීරික සුදුසුකම් අයදුම්කරුවන් කෙරෙහි තිබේ දැයි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර පරීක්ෂා කරනු ලැබේ.

6. පුහුණු කාලය :
තෝරාගනු ලබන අපේක්ෂකයන්ට මාස 03 ක පුහුණුවක් ලබා දෙනු ලැබේ.මෙම කාල සීමාව අවසානයේ පවත්වනු ලබන පරීක්ෂණයකින් සමත් නොවන අයගේ පුහුණුව අවසන් කරනු ලැබේ. පුහුණු කාලය තුළදී පුහුණුවන්නන්ට රු.20,000/- ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

7. පරිවාස කාලය :
සාර්ථක ලෙස පුහුණුව අවසන් කරන අපේක්ෂකයින් තුන්(03) අවුරුදු පරිවාස කාලයකට යටත් කොට සුරාබදු පරීක්ෂක තනතුරට පත් කරනු ලැබේ.පරිවාස කාලය අවසානයේදී අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව පවත්වන කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් වුවහොත් අදාළ තනතුරේ ස්ථිර කරනු ලැබේ.

7.1. තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හා / පත් කරන ලද තනතුරක් හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟහරින අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වරයාට බලය ඇත.

08. විභාග ගාස්තු :

මාර්ගගත (online) විභාග අයදුම්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේ දී මෙම උපදෙස් තරයේ පිළිපදින්න.

විභාග ගාස්තු රු.600/-කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Cards)
II. ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Cards)
III. ලංකා බැංකු ඔන්ලයින් බැංකින් ක්‍රමය (Bank of Ceylon Online Banking Method)
IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payment)

අයදුම්පත් භාරගැනීම 2024.02.23 දින **පෙ.ව 9.00 සිට 2024.03.22 දින මධ්‍යම රාත්‍රී 12.00** තෙක් සිදු කෙරේ.

*සටහන* :- ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තු සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

09. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කල වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය.එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම,අයදුම්කරුගේ සම්පූර්ණ

නම,ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත,විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත/විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාල ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව යම් සංශෝධනයක් සිදු කිරීමට අවශ්‍ය වන්නේ නම් අයදුම්පත් භාර ගන්නා දින සිට දින තුනක් දක්වා සඳහා පහසුකම් සලසා ඇත.

10. විභාග අපේක්ෂක /අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය.එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන් ට අයදුම්කරු හඳුනාගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරවසිටිය යුතුය.

11. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. සියලුම අයදුම්කරුවන් තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කරවා ගත යුතුය.

12. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදු වේ.

13. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එම්. ජේ. ගුණසිරි,
සුරාබදු කොමසාරිස් ජනරාල්.

2024 පෙබරවාරි මස 22 වැනි දින,

ආදර්ශ අයදුම් පත්‍රය

සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු පරීක්ෂක තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2023

මාධ්‍යය :-

1.1 විභාගයට පෙනී සිටින මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
[ ]

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

| නගරය | නගර අංකය |
|---|---|
| | |
| | |

(උපලේඛනය 1 බලන්න)

1. (i) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
(ii) සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(iii) මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

02. (i) ස්ථිර ලිපිනය(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
(iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසය :————.
(iv) ආසන්නතම පොලිස් ස්ථානය :————.
(v) ආසන්නතම සුරාබදු ස්ථානය :————.
(vi) තැපැල් ලිපිනය :————.
(විභාග ප්‍රවේශ පත්‍ර එවීම සදහා)

03. ස්ත්‍රී / පුරුෂභාවය :-

පුරුෂ - 0

ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. ජංගම දුරකතන අංකය :

06. උපන් දිනය :

2024.03.22 දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.

07. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද යන බව :————.
(පරම්පරාවෙන්ද ,ලියාපදිංචි වීමෙන්ද යන වග සඳහන් කරන්න)

08. ජාතිය :————.

09. විවාහකද /අවිවාහකද යන වග :————.

10. අධ්‍යාපන සුදුසුකම් :

(i)

| උපාධියේ නම හා වර්ෂය | විශ්ව විද්‍යාලය | වර්ෂය | ලබා ඇති පන්ති සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |

(ii) අ.පො.ස.(සා.පෙළ) විභාගයේ සාමර්ථයන්

| වර්ෂය :————.<br>විභාග අංකය :————. | |
|---|---|
| විෂයය | සාමර්ථ්‍යය |
| | |
| | |
| | |
| | |
| | |

(iii) අ.පො.ස.(උ.පෙළ) විභාගයේ සාමර්ථ්‍යයන්

| වර්ෂය :————.<br>විභාග අංකය :————. | |
|---|---|
| විෂයය | සාමර්ථ්‍යය |
| | |
| | |
| | |
| | |

11. දැනට කරන රැකියාවේ විස්තර :
..........................................................................................................................
..........................................................................................................................

12. ක්‍රීඩා හා බාහිර ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර ඃ
..........................................................................................................................
..........................................................................................................................

13. වෙනත් විශේෂ පුහුණුවීම් පිළිබඳ විස්තරඃ..........................................................................................
..........................................................................................................................

14. (i) උස ඃ සෙ. මී. (අඩි ඃ .......... අගල් ඃ......)
(ii) පපුවේ ප්‍රමාණය (ආශ්වාස නොකර) සෙ.මී. .........
(අඟල් .........)

15. සාපරාධි වරදකට කෙදිනක හෝ උසාවියකින් වරදකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර ඃ ..........................
..........................................................................................................................

16. අයදුම්කරුගේ ප්‍රකාශය
මා විසින් මෙහි සඳහන් කරඇති තොරතුරු නිරවද්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු කිරීමටත්, පත්කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් මා සේවයෙන් පහකිරීමටත් හැකි බව මම දනිමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බවද, ප්‍රකාශ කරමි. අදාළ විභාග ගාස්තුව ගෙවූ බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

උපලේඛන අංක 01

| දිස්ත්‍රික්කය / නගරය | දිස්ත්‍රික් /නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| ගාල්ල | 03 |
| යාපනය | 04 |
| ත්‍රිකුණාමලය | 05 |
| කුරුණෑගල | 06 |
| අනුරාධපුරය | 07 |
| බදුල්ල | 08 |
| රත්නපුර | 09 |

02-776/1